*සැ. යු.* - 2021.05.13 වැනි දින අංක 2228 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,229 - 2021 මැයි මස 21 වැනි සිකුරාදා - 2021.05.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් | — |
| අවසාන නියෝග | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත | — |
| මධ්‍යම පළාත | — |
| දකුණු පළාත | — |
| උතුරු පළාත | — |
| නැගෙනහිර පළාත | — |
| වයඹ පළාත | — |
| උතුරු මැද පළාත | — |
| ඌව පළාත | — |
| සබරගමුව පළාත | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත | — |
| මධ්‍යම පළාත | — |
| දකුණු පළාත | — |
| උතුරු පළාත | — |
| නැගෙනහිර පළාත | — |
| වයඹ පළාත | — |
| උතුරු මැද පළාත | — |
| ඌව පළාත | — |
| සබරගමුව පළාත | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | 132 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජුනි මස 11 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මැයි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

131- B 82232 - 352 (2021/05)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, එස්. එන්. කේ. සේරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවග න්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1984.12.28 දින අංක මාතලේ/ප්‍ර 2311 දරන ප්‍රදන පත්‍රයේ හිමිකරු වන මාතලේ, පුරිජ්ජල, වරකන්ද ඒ ජනපදය, අංක 14හි පදිංචි පී. ඩබ්ලිව්. උක්කුබණ්ඩා යන අය වෙත දරන ප්‍රදන පත්‍රයක් ප්‍රදනය කර ඇත. මෙම ඉඩමේ දැනට පදිංචි ඩබ්. ජී. විමලසිරි යන අය උක්ත ඉඩමට නීත්‍යානුකූල උරුමකරුවන් නොමැති බව දන්වමින් මෙම දීමනා පත්‍රය අවලංගු කිරීමට ඉල්ලා ඇත. එබැවින් පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.06.07 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතු ය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ කොහොන්සිය සහ මාතලේ මැදසිය පත්තුවේ, පුරිජ්ජල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පුරිජ්ජල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක 48/23/4 (අයි. 20/4, 12, 13) දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක පි. පි. මා. 671 දරන පිඹුරෙහි අංක 14 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.112ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : හේරත්ගේ වත්ත (පුද්ගලික ඉඩම),
*නැගෙනහිරට* : කැබලි අංක 15 සහ ගම්සභා පාර,
*දකුණට* : පඩිවිටගේ හේන (පුද්ගලික ඉඩම),
*බස්නාහිරට* : ඉහල වලව්වේ වත්ත (පුද්ගලික ඉඩම).

එස්. එන්. කේ. සේරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

2020 නොවැම්බර් මස 04 වැනි දින.

05-433/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් පියල් ජයසූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1995.08.17 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/දඹු/423 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වැලිහේන, දඹුල්ල පදිංචි කම්මලේ ගෙදර මුහන්දිරම් වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මා/ප්‍ර/ද/2129/95/423 යටතේ 1995.11.14 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.06.07 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වගපනහ පල්ලේසිය කෝරළේ වැලිහේන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැලිහේන නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද සර්වේයර් ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 421 අති 07 දරන කට්ටි කැඩීමේ පිඹුරේ 556 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.262/ අක්කර 00, රූඩ් 00, පර්චස් 00ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම, සේරුගස්වලයාය

*උතුරට* : කැබලි අංක 554, 555,
*නැගෙනහිරට* : කැබලි අංක 557, 562,
*දකුණට* : කැබලි අංක 562,
*බස්නාහිරට* : කැබලි අංක 538.

පියල් ජයසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
දඹුල්ල.

2021 ජනවාරි මස 26 වැනි දින.

05-433/3

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) මාදුවගේ යුරේෂ් නිශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.02.13 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතලේ/ප්‍ර/6532 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දඹුල්ල, තලකිරියාගම පදිංචි මඩහපොලරාලලාගේ ගෙදර බණ්ඩා වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මාතලේ/ප්‍ර/6532/2649/97 යටතේ 1997.04.21දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.06.07 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ, තලකිරියාගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ තලකිරියාගම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ඔහු භාරයේ ඇති සහ අංක අ. ග. සි 401 දරන පිඹුරෙහි අංක 355 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01යි, රූඩ් 03යි, පර්චස් 03ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම, තලකිරියාගම ජනපදය.

*උතුරට* : කැබලි අංක 354,
*නැගෙනහිරට* : කැබලි අංක 115,
*දකුණට* : කැබලි අංක 115,
*බස්නාහිරට* : කැබලි අංක 347 (පාර)

මාදුවගේ යුරේෂ් නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

2020 ඔක්තෝබර් මස 26 වැනි දින.

05-433/4

---

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් මාදුවගේ යුරේෂ් නිශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.04.28 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතලේ/ප්‍ර/7015 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දේවහුව, දඩුබැදිරුප්ප පදිංචි ගමරාලලාගේ ගෙදර පුංචිරාල වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ද/196/979/87 යටතේ 1987.09.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.06.07 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම්දිය යුතු ය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දපල්ල කෝරළේ, දඩුබැදිරුප්ප ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දඩුබැදිරුප්ප නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබූ ඔහු භාරයේ ඇති අංක ඇප්/25/59 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක බී. එස්. වී. පී. 399 දරන පිඹුරේ අංක 718, 720 සහ 751 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 00 අක්කර, 00 රූඩ් 02 (දෙකයි) පර්චස් 11 (එකොළහක්) ඇතැයි ගණන් බලා තිබෙන දඩුබැදිරුප්ප ජනපදය යනුවෙන් හඳුන්වනු ලබන පහත දක්වෙන පරිදි මායිම් වූ ද නමැති රජයේ ඉඩම.

| | කැබලි අංක 718 (පර්. 36), | කැබලි අංක 720 (පර්. 14) | කැබලි අංක751(රූ. 1, පර්. 1) |
|---|---|---|---|
| *උතුරට* : | කැබලි අංක 716, | කැබලි අංක 716, | කැබලි අංක 750 |
| *නැගෙනහිරට* : | කැබලි අංක 717, | කැබලි අංක 751, | කැබලි අංක 718 |
| *දකුණට* : | කැබලි අංක 719, | කැබලි අංක 721, | කැබලි අංක 752 |
| *බස්නාහිරට* : | කැබලි අංක 751, | කැබලි අංක 713, | කැබලි අංක 720 |

මාදුවගේ යුරේෂ් නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

2021 ජනවාරි මස 22 වැනි දින.

05-433/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.